**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව - 2020**

**----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.2.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

-මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාවේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.3 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී .

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදි වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.

වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ එවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.4.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.4.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලටඅනුකූල නොවීම

---

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 32 වගන්තියට පටහැනිව සමාලෝචිත වර්ෂයේ රු. 97,969,813 ක් වූ ගෙවිය යුතු නියෝජිත කොමිස් ශේෂයෙන් රු. 10,687,128 ක් වූ ලැබිය යුතු නියෝජිත කොමිස් ශේෂ හිලව් කර තිබුණි | නියෝජිත කොමිස් පාලක ගිණුමෙහි හර හා බැර සටහන් දෙකම ඇතුලත්ව ඇත .එම පරිගණක පද්ධතියෙන් ලබා ගන්නා ගිණුම් ශේෂය තුල ශුද්ධ වටිනාකම ලෙස හර හෝ බැර ශේෂය දැක්වේ.අදාල උප ලේඛණයෙහි දක්වා ඇත .<br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 ප්‍රකාරව වත්කම් හා වගකීම් හිලව් කල නොහැකි බව පසුගිය වර්ෂයන්හිදි ද පෙන්වා දී ඇති බැවින් ඉදිරියේදී ඉහත නියෝජිත කොමිස් මුදල් පාලක ගිණුමෙහි (Control Account) ශේෂයන් වෙන වෙනම ගිණුම් දෙකක දැක්වීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 හි 9 වන වගන්තියට පටහැනිව සංස්ථාව විසින් තොගවල ශුද්ධ උපලබ්ධි අගය ඇස්තමේන්තු කිරීමකින් | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 2 ප්‍රකාරව ශුද්ධ උපලබ්ධි අගයට හෝ පිරිවැයට යන වටිනාකමින් අඩු අගයට දැක්විය යුතු වුවද මෙම තොග පරිභෝජනය සඳහා පමණක් වන තොග බැවින් පිරිවැයට ගිණුම්ගත කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව තොගයේ වටිනාකම වාර්තා කළ යුතු ය. |

| | | |
|---|---|---|
| තොරව, පිරිවැය වූ රු.201,080,934 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | තොගයේ ඇතුලත් භාවිතයට ගත නොහැකි හා චලනය නොවන තොග වටිනාකම් වර්ෂ කීපයක සිට පැවත එන අතර භාවිතයට ගත නොහැකි අපහරණය කිරීමට නියමිතය.රටේ පවතින අයහපත් සෞඛ්‍ය තත්වය නිසා කල්ගිය අපහරණ කටයුතු ඉදිරියේදී සිදු කරනු ලබන අතර භාවිතයට ගත නොහැකි හා චලනය නොවන තොග ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| **(ඇ)** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 අනුව ගත්මිල රු. 3,386,515,041 ක්වූ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනට භාවිතාකරන දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ඒවායේ සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 13හි 24වගන්තියට අනුව සම්පූර්ණයෙන් ක්ෂය කළ ද එහෙත් දැනට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන දේපල හා උපකරණ ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගයට දැක්විය යුතු වු ද ප්‍රායෝගික හේතූන් මත එසේ කිරීමට අපහසු වී ඇත .එබැවින් මේ දක්වා ගත්මිළට ගිණුම්ගත කර ඇත. | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| **(ඈ)** 2018 වර්ෂයේදී සංස්ථාව වෙත ලැබුණු රු.මිලියන 100 ක රාජ්‍ය ප්‍රදානය මගින් 2019 වර්ෂයේ දී සංස්ථාව විසින් රු. 75,167,126 ක උපකරණ මිලදී ගෙන තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20 අනුව මෙම උපකරණ සඳහා ක්‍රම ක්ෂය ගණනය කිරීමේ දී මිලදී ගත් උපකරණ වටිනාකම මත ක්‍රම ක්ෂය ගණනය කරනු වෙනුවට රු. මිලියන 100 ක් වූ සම්පූර්ණ රාජ්‍ය ප්‍රදානය මත ක්‍රම ක්ෂය ගණනය කිරීම හේතුවෙන් 2020 වර්ෂය සඳහා රු. 4,966,575 ක වටිනාකමින් | මෙහි දක්වා ඇති වටිනාකම වන රුපියල් මිලියන 100ක ප්‍රදානයට අදාල වත්කම් ලබාගැනීමේ කාර්යය සම්පූර්ණ වූයේ 2019 වර්ෂයේදී වුවද භාණ්ඩ ලැබීම් පත්‍රිකා නිකුත් කර තිබුණේ 2020වර්ෂයේදීය .එම නිසා 2019 වර්ෂයේදී මාර්ගස්ථ තොග ගිණුමේ පැවතුණි.එම ශේෂයන් 2020 වර්ෂය වන විට අදාල වත්කම් ගිණුම්වලට මාරුකර ඇත. | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |

වෙනත් ආදායම් වැඩියෙන් සහ රාජ්‍ය ප්‍රදාන අඩුවෙන් දක්වා තිබුණි.

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නියෝජිත කොමිස් සම්බන්ධ තොරතුරු වෙන් වෙන්ව පරිඝනක පද්ධතියෙන් ලබාගැනීමට හැකිවෙන පරිදි සංස්ථාව විසින් එම පද්ධතිය පවත්වා නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට පවතින ගෙවිය යුතු නියෝජිත කොමිස් වූ රු.87,282,685 ක් සඳහා කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි.ඒ හේතුවෙන් එම ශේෂයන්හි වර්තමාන තත්ත්වය පරීක්ෂා කළ නොහැකි විය. | නියෝජිත ආයතන වෙත ගෙවිය යුතු කොමිස් මුදල් සම්බන්ධයෙන් වෙන්වෙන්ව සටහන් පවත්වාගත හැකි පරිදි මුදල් අංශයේ දැනට භාවිතා කරනු ලබන පරිගණක පද්ධතිය සකස් වී නොමැත.එම පරිගණක පද්ධතිය වර්ෂ ගණනාවක සිට පැවත එන බැවින් ඒ සඳහා නව වෙනස්කම් සිදු කල හැකිද යන්න පරීක්ෂා කර බැලිය යුතු වේ.කෙසේ වුවද ගෙවිය යුතු කොමිස් මුදල් සම්බන්ධ වයස් විශ්ලේෂණයක් සකස් කිරීමට පරිගණක පද්ධතියෙන් ලබාගත් දත්ත අනුව (manual) ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමාණවත් තොරතුරු පවත්වා ගත යුතු අතර නිවැරදි කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කළ යුතු ය. |

1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| | (රු.) | (රු). | (රු.) | | |
| (අ) සමුච්චිත ක්ෂය වෙන්කිරීම් | 3,694,689,745 | 3,703,594,072 | 8,904,327 | සමුච්චිත ක්ෂය වෙන්කිරීමේ වටිනාකමෙහි ඇති වෙනස පිළිබඳව සොයා බලා නිවැරදි කිරීමට ඉදිරියේදී කටයතු කරනු ලැබේ. | වෙනසට හේතු පරීක්ෂාකර ගැලපීම් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) මුදල් හා මුදල් සමාන දෑ | 103,314,232 | 108,676,857 | 5,362,625 | පසුගිය වර්ෂයන්හිදී මෙම ඉතිරිකිරීමේ ගිණුම මගින් ගණුදෙනු කිරිම අවම මට්ටමක පැවතිය. එහෙයින් ආයෝජන වට්නාකමක් සේ සලකා මෙම වට්නාකම ආයෝජන යටතේ දක්වා තිබුණි .එසේ වුවද වර්තමානයේදී මෙම ගිණුම මගින් ගණුදෙනු සිදු කරන බැවින් 2021වර්ෂයේ සිට මුදල් හා මුදල් සමාන දෑ ලෙස දැක්වීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස්කල යුතුය. |

### 1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ ශුද්ධ වත්කම් දිගින් දිගටම අඩුවෙමින් පැවතුණ අතර, 2015 වර්ෂයේදී රු.1,219,290,585 ක් වූ සංස්ථාවේ ශුද්ධ වත්කම් සමාලෝචිත වර්ෂයේ දී රු.190,563,478 ක් දක්වා රු.1,028,727,107 කින් අඩු වී තිබුණි. එසේම රාජ්‍ය ප්‍රදාන හේතුවෙන් 2018 වර්ෂයේ ලාභ ලැබුවද පසුගිය වර්ෂ 5 තුළ සංස්ථාව දිගින් දිගටම අලාභ ලබමින් පැවතුණි. තවද 2015 වර්ෂය අවසානයට රු.244,648,000 ක් වූ බැංකු අයිරාව 2019 වර්ෂයේ රු.482,718,683 ක් වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.258,728,044 ක් වී තිබුණි. මෙසේ දිගින් දිගටම අලාභ ලැබීම ශුද්ධ වත්කම් සහ හිමිකම්වලට අහිතකර ලෙස බලපා තිබුණු අතර ඒ හේතුවෙන් රජයේ මූල්‍ය | අදහස් දක්වා නොමැත | යහපත් මූල්‍ය කළමනාකරණයක් ක්‍රියාත්මක කළ යුතු අතර අලාභ තත්ත්වය මඟහරවා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු වේ. |

සහායක් නොමැතිව සංස්ථාව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) සංස්ථාව විසින් ලංකා පුවත් ආයතනයෙන් කොටස් මිල දී ගැනීම සඳහා 1985 සහ 1992 වර්ෂවලදී රු.1,104,000 ක් ආයෝජනය කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය දක්වාම කිසිඳු ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණි. | රු. 1,104,000 | ආයෝජනවල අයිතිය, පැවැත්ම හා වටිනාකම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛන | ලංකා පුවත් ආයතනය වෙතින් කොටස් සහතික ඉල්ලා සිටීමට සංස්ථාව අවස්ථා කීපයකදීම කටයුතු කර ඇත.ඒ අනුව 2014 වර්ෂයේ කරන ලද ඉල්ලීමකට පිළිතුරු ලෙස එම ආයතනය දැනුම්දී ඇත්තේ එම ආයතනයේ පිහිටීම වරින්වර වෙනස් කිරීම හේතුවෙන් කොටස් සහතික අනුපිටපත් අස්ථානගතවී ඇති බව දන්වා ඇත.<br>ලංකා පුවත් ආයතනය වර්තමානයේ ක්‍රියාත්මක මට්ටමේ නොමැත. එම ආයතනය තිබෙන ස්ථානයක් සොයාගත නොහැකි අතර මේ සම්බන්ධව යවන ලද ලිපියක් ද භාරදිය නොහැකිව ආපසු ලැබී ඇත. මෙම ආයතනය 1985 වර්ෂයේදී පිහිටුවා ඇති අතර එවකට සිටි විෂය භාර අමාත්‍යවරයාගේ උපදෙස් පරිදි මේ සඳහා ආයෝජනය කර ඇත.මේ සඳහා සාක්ෂි ලෙස කොටස් සහතිකයන්හි පිටපත් කීපයක් පවතී. | ආයෝජන සනාථ කිරීම සඳහා ලිපිලේඛන ඉදිරිපත් කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ)ගිවිසුමකින් තොරව සිදු කරන ලද ප්‍රති වෙළඳ ගණුදෙනුව | රු.3,030,564 | ප්‍රති වෙළඳ ගණුදෙනුවෙන් සංස්ථාව අදාල සේවාව ලබාගත් බවට සනාථ කෙරෙන තොරතුරු | අදහස් දක්වා නොමැත | අවශ්‍ය අවස්ථාවන්හි දී ගිවිසුම් වලට එළඹීම විධිමත් කළ යුතු අතර ගණුදෙනු වලට අදාල තොරතුරු ඉදිරිපත් කළ යුතු ය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ සමාලෝචිත වර්ෂය අවසානයට මුළු සේවාදායක ණයගැති ශේෂය රු. 507,789,779 ක් වූ අතර ඉන් රු. 229,200,950 ක් හෙවත් සියයට 45 ක් මිලියන 5ට වැඩි වටිනාකම් සහිත රාජ්‍ය ආයතනයක් ඇතුළු ණයගැතියන් 10 දෙනෙකුගෙන් නියෝජනය වී තිබුණි. එහි ඇතුළත් ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමග එළඹි විධිමත් ගිවිසුමක් නොමැති වීම නිසා බැංකුවෙන් ලැබිය යුතු මිලියන 10ක් අයකර ගැනීමට නීතිමය පියවර ගනු ලැබුවද අයකර ගැනීම අවිනිශ්චිත වී තිබුණි. එසේම රාජ්‍ය ආයතන 32 ක් ඇතුළුව 170 දෙනෙකුගෙන් සමන්විත වී තිබුණු වසර 5 ඉක්මවූ රු. 97,117,914 ක් වටිනා ණයගැති ශේෂයෙන් රු. 78,480,159 ක් නියෝජනය කරන ණයගැතියන් 153 දෙනෙකු වෙනුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් අයවීමට ඇති රු.මි.10ක මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් සඳහා යොමු කල අතර රජයේ ආයතන දෙකක් බැවින් සාකච්ඡා මාර්ගයෙන් විසඳාගැනීමට උපදෙස් ලැබුණි .ඒ අනුව මේ සම්බන්ධව ඉදිරි පියවර ගැනීමට ජනමාධ්‍ය අමාත්‍යංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී. අය විය යුතු රාජ්‍ය ණය සම්බන්ධව 2019.09.09 දින ජනමාධ්‍ය අමාත්‍යංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවති අතර එහිදී ඉහත ජා.ඉ.බැංකුවෙන් අයවිය යුතු රු.මි.10ක මුදල සම්බන්ධව බැංකු නිලධාරීන් ගෙන්වා සාකච්ඡා කර ඇත . එහිදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉහළ නිලධාරියෙකු පවසා ඇත්තේ බංකුවේ ලිඛිත අනුමැතියක් සහිතව මෙමෙ කාර්ය සිදු | ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

කර නොමැති බැවින් එයට අදාලව ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් ගෙවීම් කිරිමට නොහැකි බවයි.

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 371 (5) වගන්ති. | (i) එක් අවස්ථාවකදී ලබාදිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.100,000 ක් වුවද වැඩසටහන් නවාතැන් පහසුකම් සැපයීම් සහ මිලදී ගැනීම් සඳහා අවස්ථා 46 කදී සීමාව ඉක්මවා රු.40,406,563 ක් ලබා දී තිබුණි. | රාජ්‍ය චක්‍ර ලේඛයට අනුව අත්තිකාරම් සඳහා එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම අගය රු 100,000 ක් වුවද මෙම සංස්ථාවේ කාර්යය ස්වභාවය අනුව නිෂ්පාදන ක්‍රියාවලියේදී එම වටිනාකම ඉක්මවා අත්තිකාරම් ලබා දීමට සිදු වී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) අදාල කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට අවස්ථා 09 කදී ලබාදී තිබුණු වර්ෂය ඉක්මවූ අත්තිකාරම් ශේෂය රු. 6, 606,962 ක් විය. | අදාල කාර්ය අවසන් කර දින 10ක් ඇතුලත අත්තිකාරම් පියවිය යුතු වුවද සංස්ථාවේ වැඩසටහන් නිෂ්පාදන ක්‍රියාවලියේ ස්වාභාවය අනුව ප්‍රායෝගිකව එසේ කළ නොහැකි අවස්ථාවලදී ඉහළ කළමණාකාරිත්වයේ අනුමැතිය මත අත්තිකාරම් පියවීමටඅමතරකාලයක් ලබාදෙනු ලැබේ. අත්තිකාරම් නොපියවන අවස්ථාවල අදාල නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | | | |
| (i) 2015 ජුනි 16 දිනැති අංකපීඊඩී 3/2015 දරන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව සභාපතිවරයාට ගෙවිය යුතු දීමනාවට අමතරව විශේෂ දීමනා හා වෙනත් දීමනා ලෙස රු. 548,388 සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණි. | සංස්ථා සභාපතිවරයාගේ මාසික දීමනාව ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කර රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ (02)/58අනුව එවැනි අතිරේක දීමනාවක් ගෙවීමට බාධාවක් නොතිබු බැවින් 01/10/2010 සිට සංස්ථා මණ්ඩල අනුමැතිය සහිතව රු. 30,000 ක අතිරේක දීමනාවක් ගෙවා ඇත . සංශෝධිත රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ PED 2015/03 හි 2.8 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව එම අතිරේක දීමනාව අනුමැතිය සඳහා එවක රේඛීය අමාත්‍යාංශය වූ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත 2018.07.08 දිනැතිව යොමු කර ඇත.<br>2020 වර්ෂයේදී සංග්‍රහ දීමනාව රු. 20,000.00 දක්වා අඩු කර වර්තමානයේ සභාපතිවරයා විසින් අතිරේක දීමනාවක් ලබා නොගනී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 දරන චක්‍රලේඛය | | | |
| (i) 2.3 ඡේදය | ප්‍රවාහන හා ඉන්ධන දීමනාව සඳහා හිමිකම් නොමැති නිලධාරීන් 99 දෙනෙකුට ප්‍රවාහන හා ඉන්ධන දීමනාව ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. 8,203,940 ක් ගෙවා තිබුණි. | සංස්ථාව ආරම්භයේ සිට විධායක ශ්‍රේණියේ නිලධාරින්ට ඉන්ධන දිමනාවක් ගෙවා ඇති අතර පැවති ශ්‍රේණි ක්‍රමය අනුව IV ශ්‍රේණියට උසස් වීම් ලද | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | විධායක නොවන නිලධාරින්ට සංස්ථා මණ්ඩල අනුමැතිය සහිතව මසකට රු 2,000.00. ප්‍රවාහන දීමනාවක් ගෙවා ඇත. 2010 වර්ෂයේ දී අවසන් සංශෝධනය සිදුකර ඇති අතර එය අමාත්‍යාංශ නිර්දේශ සහිතව මහා භාණ්ඩාගාර අනුමැතියට යොමු කර ඇත. සංස්ථාව ආරම්භයේ සිට ලබා දී තිබු වරප්‍රසාදයක් වන බැවින් අඛණ්ඩව ගෙවීම් සිදු කර ඇත. | |

## 1.8 මුදල් කළමනාකරණය

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ පවත්වා ගෙන යන බැංකු ජංගම ගිණුම් දෙකකට අදාලව සමාලෝචිත වර්ෂයේදී එක් මාසයක් හැර සෑම මාසයකම අනුමත අයිරා සීමාව ඉක්මවා තිබුණු අතර බැංකු අයිරාවන් සඳහා පොලී ලෙස රු. 29,085,302 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | සමාලෝචිත වර්ෂය තුලදී පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් සංස්ථාවේ ආදායම් තත්වය පහළ ගිය අතර එය මූල්‍ය තත්වය අයහපත්විම හේතු විය.එබැවින් දෛනික අවශ්‍යතා වෙනුවෙන් බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමට සිදු විය .ඒ අනුව ඒ සඳහා පොලී ගෙවීමට සිදු විය. | බැංකු අයිරාව අදාල සීමාව ඉක්මවා නොයන පරිදි පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.234,300,093 අලාභය වූ අතර ඉකුත් වර්ෂයේ රු.461,039,399 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.226,739,306 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට 2020 මූල්‍ය වර්ෂයේ පුනරාවර්තන වියදම් වෙනුවෙන් ලැබුණු රු. 310,000,000 ක් වටිනා රාජ්‍ය ප්‍රදානය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ගුවන් කාල විකුණුම් ආදායම රු.1,049,126,350 හා පෙර වර්ෂයේ ගුවන් කාල විකුණුම් ආදායම රු.1,742,947,899 හා සැසඳීමේ දී පෙර වර්ෂයට සාපේක්ෂව ගුවන් කාල විකුණුම් ආදායම සියයට 40 කින් අඩු වී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී වැඩසටහන් හා බෙදාහැරීමේ වියදම සහ බදු වියදම පිළිවෙලින් සියයට 28 කින් හා සියයට 62 කින් අඩු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

පසුගිය වර්ෂ තුනක දළ ලාභය හා ශුද්ධ ලාභය අඩුවෙමින් පැවතුණ අතර , සමාලෝචිත වර්ෂයේදී එය සෘණ අගයක් දක්වා අඩු වී ජංගම අනුපාතය ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)1971 අංක 38 දරන මුදල් පනතේ 7(1) ඡේදයේ සඳහන් පරිදි ආදායම් ගිණුමේ අන්ත අතිරික්තය එම ගිණුමේ අන්ත ඌනය අවුරුදු පහක කාල සීමාවක් තුළ හෝ මුදල් ඇමතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මොනයම් කාලසීමාවක් තුළ පියවීමට ප්‍රමාණවත් වන පරිදි නීතිගත සංස්ථාවේ කටයුතු පවත්වාගෙන යාම එම නීතිගත සංස්ථාවේ පාලක මණ්ඩලයේ වගකීම වුව ද ආසන්නතම වර්ෂ පහක ශුද්ධ අලාභය රු.943,832,028 ක් වූයෙන් සංස්ථාවේ ක්‍රියාකාරිත්වය එම අපේක්ෂිත තත්ත්වයට ළඟා වී නොමැති බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත | අලාභ තත්ත්වය මඟහරවා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය |

| | | |
|---|---|---|
| (ආ) සංස්ථාව ස්ථාපිත 1982 වර්ෂයේ සිට ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යනු ලබන කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි අක්කර 8 ක් පමණ විශාල ඉඩම සහ ගොඩනැගිලි සංකීර්ණයෙහි නෛතික අයිතිය පවරාගෙන එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. | රූපවාහිනි සංස්ථා ඉඩමේ නිත්‍යානුකූල අයිතිය සංස්ථාව වෙත ලබා ගැනීම සඳහා 2014.03.11දිනැතිව ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා විසින් අමාත්‍යමණ්ඩලය වෙත ඉදිරිපත් කළ සංදේශය සම්බන්ධයෙන් 2014.05.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය වී ඇත්තේ මෙම කරුණ විසඳා ගැනීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා එක්ව සාකච්ජා කළ යුතු බවයි.<br>ඒ අනුව දැනට රූපවාහිනී සංස්ථාව විසින් භුක්ති විඳින ඉඩම සංස්ථාව වෙත පවරාදිමට බස්නාහිර පලාත් ආණුඩුකාරවරයා විසින් එකඟතාවය පළ කර ඇත.එම එකඟතාවය සමග ඉදිරි කටයුතු කිරීම පිණිස 2021.10.30දිනැතිව ඉඩම් කොමසාරිස් ජනරාල් වරයා වෙත ලිපියක් යැවීමට කටයුතු කර ඇත. | දේපල පිළිබඳ නෛතික අයිතිය ලබාගෙන එම වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව ලොවට ගෙනයාම හා විදේශගත ලාංකිකයන්ගේ දැනුම රසාස්වාදය ප්‍රවර්ධනය සඳහා චන්ද්‍රිකා තාක්ෂණය ඔස්සේ ඉතාලියේ හෝ යුරෝපයේ ස්ථාපිත මැදිරියක රූපවාහිනී නාලිකාවක් පවත්වාගෙන යාමටත් ඊට අවශ්‍ය උපකරණ තාවකාලිකව බදු පදනම යටතේ මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය මත ලබා ගැනීමටත් 2014 දෙසැම්බර් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව අත්තිකාරම් වශයෙන් 2015 ජනවාරි 02 දින රු.3,454,279 ක් පෞද්ගලික සමාගමකට මුදල් | චන්ද්‍රිකා තාක්‍ෂණය ඔස්සේ යුරෝපයේ වෙනත් රටක සිට රූපවාහිනී නාලිකාවක් පවත්වාගෙන යෑම පිණිස අත්තිකාරම් වශයෙන් 02/01/2015දින රු.3,454,279ක් ගෙවීම සම්බන්ධව අදාල ආයතනයට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත .එම නඩුව දැනට විභාග වෙමින් පවතී. | අවශ්‍ය අවස්ථාවන්හිදී විධිමත් ගිවිසුම් වලට එළඹිය යුතු අතර ගෙවන ලද අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

අමාත්‍යාංශ එකඟතාවයෙන් තොරව ගෙවා තිබුණද 2015 වර්ෂයෙන් පසුව මෙම කාර්යය සම්පූර්ණයෙන් අත්හැර දමා තිබුණු අතර ගෙවූ අත්තිකාරම අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 වර්ෂය තුළදී ගාස්තු අයකල යුතු වුවද ගාස්තු අය කිරීමෙන් තොරව විකාශය කළ වැඩසටහන් 80 ක් සඳහා වූ ගුවන් කාලය පැය 119 විනාඩි 37 ක් වෙනුවෙන් රු.30,250,006 ක් වූ ගුවන්කාල වටිනාකමක් සංස්ථාව අහිමි වී තිබුණි. | රජයේ රූපවාහනී නාලිකාව ලෙස සමහර ජාතික වැදගත් කමකින් යුතු අවස්ථා අයකිරීමකින් තොරව විකාශය කරනු ලබන අවස්ථා ඇත.උදාහරණ ලෙස මහනාහිමි වහන්සේ නමකගේ හෝ වෙනත් ආගමික පූජක උතුමකුගේ ආදාහන අවස්ථා ,ආගමික උත්සව අවස්ථා හා වෙනත් ජාතික වැදගත්කමකින් යුතු වැඩසටහන් නොමිලේ විකාශය කිරීමට සිදුවන අවස්ථා ඇත. | අලාභ තත්ත්වය මගහරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථිර තනතුරු පුරප්පාඩු 182 ක් හා වැඩබලන තනතුරු 28 ක් ද පැවතුණ අතර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව නොතිබුණු තනතුරු 14 ක් සඳහා ස්ථිර සේවකයන් 27 දෙනෙකු, කොන්ත්‍රාත් සේවකයින් 12 සහ සේවකයන් 02 ක් කාර්ය පැවරුම් පදනම යටතේ බඳවාගෙන තිබුණි. | සංස්ථාවට අනුමත කාර්ය මණ්ඩලය ස්ථිර 1041 සහ කොන්ත්‍රාත් 08ක් වේ.2020.12.31 දින වන විට ස්ථිර කාර්ය මණ්ඩලය 867ක් කොන්ත්‍රාත් හා සේවා පැවරුම් කාර්ය මණ්ඩලය 27වූ අතර ඒ අනුව සමස්ථ කාර්ය මණ්ඩලය 894 ක් විය 2020.12.31 .වන විට වැඩ බැඩලීම් පත්වීම් 25ලෙස සඳහන් වුවද එය වැරදි වන අතර එදිනට වැඩ බැලීම් පත්වීම් ගණන 08ක් පමණක් විය. | අනුමත කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් කළ යුතුය. |